# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1612/32 - 2009 ජූලි 31 වැනි සිකුරාදා - 2009.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.—බී.13/2008.

**2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත**

2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 11, 17 සහ 20(2) වගන්ති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (2) ඡේදය සමඟ කියවිය යුතු එකී පනතේ 44 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

ජනාධිපති.

2009 ජූලි මස 30 දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2009 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සඳහා වූ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (අ) (මෙහි මින් මතු අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා මහ බැංකුව අධීක්ෂණ අධිකාරිය වශයෙන් කටයුතු කළ යුතු අතර ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් විධිමත් කිරීම හා සමීක්ෂණය කිරීම සඳහා එම බැංකුව වගකිව යුතු ය.

(ආ) අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ සහ එහි අන්තර්ගත නියම හා කොන්දේසිවලට අනුකූලව මිස, යම් තැනැත්තකු විසින් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු වශයෙන් සේවයේ නියුක්තවීම හෝ ක්‍රියා කිරීම හෝ නැතහොත් සේවයේ නියුක්තවීමට හෝ ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තෙකු යෙදවීම හෝ නොකළ යුතු ය.

3. බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක් ම මෙම නියෝගවල පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතු ය.

4. මෙම නියෝගවල විධිවිධානවලට අනුකූලව අධිකාරියේ කර්තව්‍යය ඉටු කිරීම සඳහා අධිකාරිය විසින් (මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ලිඛිතව බලය දෙනු ලැබිය යුතු ය.

5. (අ) මෙහි පහත සඳහන් කරනු ලබන තැනැත්තන්, ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් ලෙස සේවා සැපයීමේ නියැලීමට හෝ එවැනි සේවා සැපයුම්කරුවකුගේ කර්තව්‍ය ඉටු කිරීමට හෝ සුදුසුකම් ලබන්නෝය, එනම් —

(i) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ;

(ii) යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ;

(iii) ලියාපදිංචි මූල්‍ය සමාගමක් ;

(iv) අවම වශයෙන් රුපියල් මිලියන හැත්තෑපහක (75) නිරවුල් ප්‍රාග්ධනයක් ඇති පොදු සමාගමක්.

(ආ) ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු ලෙස සේවා සැපයීමේ කර්තව්‍ය ඉටු කරනු ලබන හෝ එසේ සේවා සැපයීමෙහි නියුතු යම් සුදුසුකම්ලත් තැනැත්තෙක් හෝ ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකුගේ තත්ත්වයෙන් යම් ව්‍යාපාරයක් කරගෙන යෑමට අපේක්ෂා කරනු ලබන යම් සුදුසුකම්ලත් තැනැත්තකු හෝ විසින් මේ නියෝග ක්‍රියාත්මක වීමේ දින හෝ ඉන්පසු අවස්ථාවෝචිත පරිදි මේ නියෝග ක්‍රියාත්මක වීමේ දින සිට මාස හයක (06) කාලයක් තුළ හෝ ඔහුගේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පෙර දින හැටක් (60) ඇතුළත, හෝ මෙහි පළමුවැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන්, බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කළ යුත්තේ ය. එකී ඉල්ලුම්පත්‍රය සමග අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන ලියකියවිලි, තොරතුරු හෝ වෙනත් යම් විස්තර ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක් සමග ම මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන වාර්ෂික බලපත්‍ර ගාස්තුව ද, එම ඉල්ලුම්පත්‍රයට ඇමිණිය යුතු බවට නියම කරනු ලබන ලේඛන ද අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් තොරතුරු ද ඉදිරිපත් කළ යුතු ය.

6. පහත දැක්වෙන කාරණා පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසු, මෙහි තුන් වන උපලේඛනයේ නිශ්චිත ව දැක්වෙන ආකෘති පත්‍රය අනුව අධ්‍යක්ෂවරයා විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය :-

(අ) මෙහි දෙවැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන වාර්ෂික බලපත්‍ර ගාස්තුව ගෙවීම ;

(ආ) අවස්ථාවට අනුකූල වූ පදනමක් මත අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන ලේඛන ;

(ඇ) අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන වැඩිමනත් තොරතුරු.

7. (අ) අධ්‍යක්ෂවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ ඔහු විසින් වාර්තාගත කල යුතු හේතු අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(ආ) මෙම නියෝගයේ (අ) ඡේදය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් —

(i) එම බලපත්‍රය නිකුත් කිරීමේ දින සිට අවුරුදු එකක කාලයක් සඳහා වලංගු විය යුතු ය ;

(ii) මෙහි තුන්වන උපලේඛනයේ නිශ්චිත ව දැක්වෙන ආකෘති පත්‍රයට අනුව නිකුත් කරනු ලැබිය යුතු ය ;

(iii) එම බලපත්‍රයේ පසු පිටේ දැක්වෙන කොන්දේසිවලට යටත් ව නිකුත් කරනු ලැබිය යුතු ය.

8. ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු විසින් පවත්වාගෙන යනු ලබන විවිධ වර්ගයේ ව්‍යාපාර කටයුතු සැලකිල්ලට ගෙන, කලින් කල මෙම නියෝගවල 2 වැනි උපලේඛනයේ දක්වා ඇති ආකාරයට ගණනය කරනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් සෑම සේවා සැපයුම්කරුවකු විසින්ම අධිකාරිය වෙත ගෙවනු ලැබිය යුතු ය.

9. මෙහි 7 වැනි නියෝගයේ (අ) වැනි ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම එම බලපත්‍රය නිකුත් කළ දින සිට අවුරුදු එකක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, එම බලපත්‍රයේ වලංගු කාල සීමාව අවසන් වීමට මාස දෙකකට පෙර එම ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරු විසින්, එම බලපත්‍රයේ පසු පිටේ දැක්වෙන කොන්දේසිවලට යටත් ව එම බලපත්‍රය අළුත් කිරීම සඳහා මෙහි හතර වැනි උපලේඛනයේ නිශ්චිත ව දක්වා ඇති ආකෘතියෙන් අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් කළ යුතු ය.

10. යම් සේවා සැපයුම්කරුවෙකු —

(i) අසත්‍ය හෝ වැරදි සහගත තොරතුරු ඉදිරිපත් කර ඇති බවට හෝ යම් වැදගත් තොරතුරක් ඉදිරිපත් කර නොමැති බවට ; හෝ

(ii) තම ව්‍යාපාරයට හානිදායක වන අන්දමින් මූල්‍ය වගකීම් පිළිබඳ අස්ථිරභාවයකට මුහුණ දෙමින් සිටින බවට ; හෝ

(iii) අධ්‍යක්ෂවරයාගේ මතය අනුව, කාඩ්පත් දරන්නන්ට, වෙළඳුන්ට හෝ ශ්‍රී ලංකාවේ ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරයට හානිදායක වීමට ඉඩ ඇති දුර්වල ආපදා කළමනාකරණයකට යටත්ව සිටින බවට ; හෝ

(iv) අධ්‍යක්ෂවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන කාලයක් ඇතුළත අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන විශෝධන ක්‍රියා මාර්ග ගැනීමට අපොහොසත් වී ඇති බවට ; හෝ

(v) බලපත්‍රය නිකුත් කිරීමේ දින සිට මාස හයක් (06) ඇතුළත ගෙවීම් කාඩ්පත් වලට අදාල තම ව්‍යාපාරය ආරම්භ කිරීමට එම සේවා සැපයුම්කරු අපොහොසත් වී ඇති බවට ; හෝ

(vi) පනතේ යම් විධිවිධානයකට හෝ පනත යටතේ නිකුත් කරන ලද යම් නියෝගයකට, විධානයකට, නියමයකට, රීතියකට, කොන්දේසියකට, චක්‍රලේඛයකට හෝ නියමු උපදේශයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බවට ; හෝ

(vii) අධිකරණයක් විසින් යම් වරදක් සඳහා වරදකරු කරනු ලැබ ඇති බවට,

අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන පරිදි ඔප්පුවනු ලබන්නේ නම්, අධ්‍යක්ෂවරයා විසින් —

*(අ)* එම තැනැත්තාට බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම ; හෝ

*(ආ)* ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු වෙත දැනටමත් නිකුත් කර ඇති බලපත්‍රයක් අවලංගු කිරීම සහ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම ; හෝ

*(ඇ)* 26 වන වගන්තියේ නිශ්චිතව දැක්වෙන, අනුකූලව ක්‍රියා නොකිරීම් සඳහා වූ ගාස්තුවක් අය කිරීම

කරනු ලැබිය හැකිය.

11. ස්වකීය තීරණය සඳහා වූ හේතු ඉදිරිපත් කරමින්, තමා විසින් 10 වැනි නියෝගය යටතේ ගනු ලැබූ තීරණය, අධ්‍යක්ෂවරයා විසින් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරු වෙත ලිඛිත ව දැනුම් දිය යුතු ය.

12. *(අ)* 10 වැනි නියෝගය යටතේ අධ්‍යක්ෂවරයා විසින් ගනු ලබන තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු හෝ ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවෙකු හෝ විසින්, 11 වැනි නියෝගය යටතේ කරන ලද දැනුම්දීම ලැබී දින තිහක් (30) ඉකුත් වීමට පෙර, අධ්‍යක්ෂවරයා විසින් ගනු ලැබූ එකී තීරණය වෙනස් කිරීම හෝ වෙනතකට හැරවීම හෝ සංශෝධනය කිරීම හෝ කළ යුත්තේ මන්ද යන්න පිළිබඳ ව හේතු ඉදිරිපත් කරමින් අධිකාරිය වෙත හෝ ඒ සඳහා අධිකාරිය විසින් ලිඛිත ව බලය පවරන ලද යම් තැනැත්තකුට හෝ අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

*(ආ)* එකී තීරණය ගැනීමේ දී, අධිකාරිය හෝ අධිකාරිය වෙතින් ඒ සඳහා ලිඛිතව බලයලත් තැනැත්තා හෝ විසින් පනතේ හෝ පනත යටතේ නිකුත් කරනු ලැබූ යම් නියෝග, නියමයන්, විධාන, නියමු, උපදෙස්, රීති හෝ කොන්දේසි සැළකිල්ලට ගතයුතු අතර එකී අභියාචනය ලැබීමෙන් දින හැටක් ඇතුළත එකී තීරණය අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතු ය.

*(ඇ)* පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් නියෝග, විධාන, නියමු උපදෙස්, රීති, කොන්දේසි සහ නිකුත් කරන ලද චක්‍රලේඛවලට අනුකූලව, අධිකාරිය විසින් හෝ අධිකාරියේ ලිඛිත අවසරලත් තැනැත්තකු විසින් හෝ දෙන ලද තීරණය අධ්‍යක්ෂවරයා විසින් පිළිපැදිය යුතු අතර *(ආ)* ඡේදය යටත් කරනු ලැබූ එකී තීරණය, එය ලැබුණු දින සිට දින දහ හතරක් ඇතුළත එකී තැනැත්තාට හෝ සේවා සැපයුම්කරුට හෝ දැනුම් දිය යුතු ය.

13. බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබූ හෝ අවලංගු කරනු ලැබූ හෝ අවස්ථාවක, එම ව්‍යාපාරය වහාම නවත්වන ලෙස සහ එම ව්‍යාපාරය පවත්වාගෙන යාමෙන් වළකින ලෙස සේවා සැපයුම්කරු වෙත අධ්‍යක්ෂවරයා විසින් විධාන කළ යුතුය. අධ්‍යක්ෂවරයා විසින් අධිකාරියේ හෝ අධිකාරිය වෙතින් ලිඛිත ව බලය ලැබූ තැනැත්තාගේ හෝ එකී තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර මේ පනතේ විධිවිධානවලට හෝ මෙම නියෝගවලට හෝ අනුකූලව ගනු ලැබිය යුතු ය.

14. යම් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකුගේ එතැන් පරීක්ෂාවක් සහ අධීක්ෂණයක් හෝ දුරස්ථ පරීක්ෂාවක් හෝ අධීක්ෂණයක්, අධ්‍යක්ෂවරයා විසින් සිදු කරනු ලැබිය හැකිය. එම පරීක්ෂාව සිදුකිරීමේ ආකෘතිය සහ කාර්ය පටිපාටිය ද අධීක්ෂණය කරන කාලසීමාව සහ අදාල නිර්නායක අධීක්ෂණය කරන කාලය තුළ ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුගෙන් ලබා ගත යුතු තොරතුරු යනාදිය පිළිබඳ ව ද අධ්‍යක්ෂවරයා විසින් කලින් කල විධාන, නියමයන්, නියමු උපදෙස්, රීති, කොන්දේසි, උපදෙස් සහ චක්‍රලේඛ නිකුත් කරනු ලැබිය හැකිය.

15. අධීක්ෂණය අතරතුර දී හෝ ලැබුණු යම් තොරතුරක් මත කරන ලද පරීක්ෂණයකින් පසුව හෝ

*(අ)* යම් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු බුන්වත්භාවයට පත් වී ඇති බවට හෝ බුන්වත්භාවයට පත්වීමට ඉඩ ඇති බවට ; හෝ

*(ආ)* ගෙවීම් කාඩ්පත් වලට අදාල ව්‍යාපාරය පවත්වාගෙන යාමට යම් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවෙකුට නොහැකි බවට ; හෝ

*(ඇ)* යම් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකුගේ ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යාම මගින් මූල්‍ය පද්ධතියේ ස්ථාවර භාවයට අහිතකර බලපෑමක් ඇතිවීමට ඉඩ ඇති බවට ; හෝ

*(ඈ)* යම් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකුගේ ව්‍යාපාර කටයුතු ඒ ආකාරයට දිගටම පවත්වාගෙන යාම ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාවට සහ ශ්‍රී ලංකාවේ ගෙවීම් පද්ධතිවල විශ්වසනීයත්වයට සහ සංවර්ධනයට අහිතකර විය හැකි බවට

හෙළිදරව් වුවහොත් ගෙවීම් කාඩ්පත්වලට අදාල ස්වකීය ව්‍යාපාරය වහාම අත්හිටුවන ලෙස අධ්‍යක්ෂවරයා විසින් එම සේවා සැපයුම්කරුට විධාන කළ යුතු අතර අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ එවැනි කොන්දේසි අනුව, විශෝධන ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

**ව්‍යාපාරය ස්වෙච්ඡාවෙන් අවසන් කිරීම**

16. මෙහි 7 වැනි නියෝගයේ *(අ)* ඡේදය යටතේ නිකුත් කරන ලද ගෙවීම් බලපත්‍රයක වලංගු කාලය තුළ ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකුගේ ව්‍යාපාරය අවසන් කළ යුතු බවට එම සේවා සැපයුම්කරුගේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලබන අවස්ථාවක, එම ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරු විසින් එම යෝජනා සම්මතයේ දින සිට දින හතක් (07) ඇතුළත -

*(අ)* ව්‍යාපාරය අවසන් කිරීම සඳහා වූ හේතු හෝ එම ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යාමට නොහැකිවීම සඳහා වූ හේතු ; සහ

*(ආ)* දැනට සිටින ගනුදෙනුකරුවන්ගේ අයිතිවාසිකම් හා බැඳීම් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳ විස්තරාත්මක යෝජනාවක් හෝ එකග වූ සේවාවන් සැපයීම සඳහා වූ විකල්ප ක්‍රමයක්

අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතු ය.

17. ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු විසින් සේවා සැපයීම ස්වෙච්ඡාවෙන් අවසන් කරනු ලැබිය යුත්තේ අධිකාරියේ අනුමැතිය ඇතිව සහ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන විධාන වලට හෝ නියම කරනු ලබන කොන්දේසිවලට හෝ අනුව පමණි.

18. ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකුගේ සේවය අවසන් කිරීමට ගන්නා ලද තීරණය දැනුම් දීමෙන් පසුව අධ්‍යක්ෂවරයා විසින්, සේවය අවසන් කිරීමේ ක්‍රමය පිළිබඳ ව සහ එම අවසන් කිරීම සිදුවිය යුත්තේ යම් කොන්දේසිවලට යටත් ව ද එම කොන්දේසි පිළිබඳ ව ද විධාන නිකුත් කරනු ලැබිය යුතු ය.

19. මෙම නියෝග ක්‍රියාත්මක වීම ඇරඹීම සිදුවන විට දී ගෙවීම් කාඩ්පත් වලට අදාළ යම් ව්‍යාපාරයක නියැලි සිටින, සහ මෙම නියෝගවලට අනුකූලව බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව එම ව්‍යාපාරය පවත්වාගෙන යන යම් තැනැත්තකු එම ව්‍යාපාරය පවත්වාගෙන යාමෙන් වැළකිය යුතු අතර අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් තුළ සහ එකී තීරණය කරනු ලබන ආකාරයට සහ කොන්දේසිවලට යටත්ව එම ව්‍යාපාරය ස්වෙච්ඡාවෙන් අවසන් කිරීමට කටයුතු කළ යුතු ය.

20. 19 වන නියෝගයේ විධිවිධානවලට පටහැනිව යම් තැනැත්තකු විසින් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන බවට තොරතුරු ලැබීමේ දී අධ්‍යක්ෂවරයා විසින් පරීක්ෂණයක් පවත්වා සේවා සැපයුම්කරු ලෙස සේවයේ නියැලී සිටින හෝ ක්‍රියා කරන යම් තැනැත්තකුට කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබා දී මේ නියෝගවල හෝ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

**සාමාන්‍ය විධිවිධාන**

21. අධිකාරිය විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා හරහා කලින් කල විධාන, නියමයන්, නියමු උපදෙස්, කොන්දේසි, චක්‍රලේඛ, රීති සහ උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි ය :-

*(අ)* යම් ගෙවීම් කාඩ්පත් හා කාඩ්පත්වල සීමාවන්, සහ ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරු විසින් සපයනු ලැබිය හැකි සේවා පරිපාලනය කිරීම ;

*(ආ)* ණය කාඩ්පත් හෝ අයභාර කාඩ්පත්වලට අදාළ ව්‍යාපාර කටයුතු ;

*(ඇ)* හර අයකිරීම් කාඩ්පත් හෝ අගය රාශිගත කාඩ්පත්වලට අදාළ ව්‍යාපාර කටයුතු ;

*(ඈ)* (ආ) සහ (ඇ) ඡේද යටතේ නිශ්චිතව දක්වා ඇති ගෙවීම් කාඩ්පත් හැර, වෙනත් ගෙවීම් කාඩ්පත් සම්බන්ධයෙන් අදාළ ව්‍යාපාර කටයුතු ;

*(ඉ)* ගෙවීම් කාඩ්පත් වලට අදාළ ආරක්ෂක ලක්ෂණ හෝ තාක්ෂණය වැඩි දියුණු කිරීම ;

*(ඊ)* ගෙවීම් කාඩ්පත් පිළිබඳ ව ගණුදෙණුකරුවන්, වෙළෙන්දන් සහ මහජනතාව දැනුවත් කිරීම සහ ඔවුන්ට තොරතුරු ලබාදීම ;

*(උ)* ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන්ට අදාළ විචක්ෂණ අවශ්‍යතා ;

*(ඌ)* ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ නියෝජිතයන් සහ උපසමාගම් සහ බාහිර ප්‍රභවයන්ගෙන් සේවා ලබා ගැනීමේ වැඩ පිළිවෙල ;

*(එ)* ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සම්බන්ධයෙන් වූ අවශ්‍යතා සාංගමික කරුණු පිළිබඳ ප්‍රමිති සහ නියමු උපදෙස්, යහපාලනය, අවදානම් කළමනාකරණය සහ පාලනය, ප්‍රාග්ධනය ප්‍රමාණවත් භාවය සහ වෙනත් ප්‍රාග්ධන අවශ්‍යතා සහ ව්‍යාපාර හා ආයෝජන බලතල ; සහ

*(ඒ)* ගෙවීම් කාඩ්පත් ගනුදෙනුකරුවන් සහ සේවා සැපයුම්කරුවන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර.

22. බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම්පත්‍රයෙහි නිශ්චිතව දැක්වෙන ව්‍යාපාර වර්ගය හැර, ගෙවීම් කාඩ්පත් වලට අදාළ වෙනත් යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අදහස් කරන යම් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු විසින් ඒ සඳහා අධිකාරියේ පූර්ව අනුමැතිය ලබාගත යුතු ය. එවැනි සේවා සැපයුම්කරුවකු විසින් මෙහි පස්වැනි උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය, අනුව පූර්ව අනුමැතිය සඳහා ඉල්ලුම් කළ යුතු ය. එසේ අනුමත කරනු ලැබුවහොත් ලබාදීමට අපේක්ෂිත සේවය මත පදනම්ව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන අතිරේක බලපත්‍ර ගාස්තුවකට හෝ බලපත්‍ර ගාස්තුව වැඩිකිරීමකට හෝ වෙනත් යම් කොන්දේසියකට එම සේවා සැපයුම්කරු යටතේ කරනු ලැබිය හැකි ය.

23. ශාඛා කාර්යාලයක් පිහිටුවීමට යම් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු අදහස් කරන අවස්ථාවක එම සේවා සැපයුම්කරු විසින් අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඒ සඳහා ලබාගත යුතු ය.

24. මෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි බලපත්‍රයක් නිකුත් කිරීම හෝ බලපත්‍රයක් අළුත් කිරීම හෝ පූර්ව අනුමැතිය ලබාගැනීම හෝ සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් තත්කාර්ය සඳහා මේ නියෝගයේ පළමුවන, හතරවැනි හා පස්වැනි උපලේඛනවල නිශ්චිත ව දැක්වෙන ආකෘති පත්‍ර අනුව අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

25. සියලු අවස්ථාවන්හි දී, ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් මෙම නියෝගවලට සහ මේ පනත යටතේ නිකුත් කරනු ලබන යම් විධානයකට, නියමයකට, නියමු උපදේශයකට, රීතියකට, උපදේශයකට, කොන්දේසියකට සහ චක්‍රලේඛයකට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

26. *(අ)* යම් තැනැත්තෙකු මේ පනත යටතේ නිකුත් කරන ලද යම් නියෝගයකට, හෝ යම් විධානයකට, නියමයකට, නියමු උපදේශයකට, රීතියකට, උපදේශයකට, කොන්දේසියකට හෝ චක්‍රලේඛයකට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින අවස්ථාවක එම ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරු 29 වන නියෝගයේ විධිවිධානවලට යටත්ව අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද අනුකූලව ක්‍රියා නොකිරීමේ ගාස්තුවට යටත් විය යුතුය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන පිළිවෙල අනුගමනය කළ යුතුය :—

(i) අනුකූලව ක්‍රියා නොකිරීමේ 1 වැනි අවස්ථාව සඳහා - අවවාද කිරීමේ ලිපියක් ;

(ii) අනුකූලව ක්‍රියා නොකිරීමේ 2 වැනි අවස්ථාව සඳහා - රු. 50,000 ක, අනුකූලව ක්‍රියා නොකිරීමේ ගාස්තුවක් ;

(iii) අනුකූලව ක්‍රියා නොකිරීමේ 3 වැනි අවස්ථාව සඳහා - රු. 100,000 ක, අනුකූලව ක්‍රියා නොකිරීමේ ගාස්තුවක් ;

(iv) අනුකූලව ක්‍රියා නොකිරීම දිගටම සිදුකරන විට, හෝ තුන්වන අවස්ථාවට පසුව තවදුරටත් අනුකූලව ක්‍රියා නොකරන විට, අධිකාරිය විසින් අඛණ්ඩව අනුකූලව ක්‍රියා නොකිරීමේ ගාස්තුවක් වශයෙන්, අධිකාරිය විසින් තීරණය කරනු ලබන රුපියල් 500,000 කට වැඩි නොවන මුදලක් අයකරනු ලැබිය හැකි ය.

*නැතහොත්*

ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුට නිකුත් කර ඇති බලපත්‍රය අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා එම අධිකාරිය විසින් වහාම අත්හිටුවනු ලැබිය හැකි අතර එම අත්හිටුවීම අවම වශයෙන් එක් සිංහල පත්‍රයක සහ එක් දෙමළ පත්‍රයක දැන්වීමක් පළකිරීම මගින් අධ්‍යක්ෂවරයා විසින් මහජනතාව වෙත දැනුම් දිය යුතු ය.

*(ආ)* මෙම නියෝගවල (අ) ඡේදය යටතේ අයකරනු ලබන මුදල්, මහ බැංකුවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

27. පනතේ විධිවිධාන හෝ පනත යටතේ නිකුත් කරන ලද යම් නියෝගයක්, විධානයක්, නියමු උපදේශයක්, රීතියක්, උපදෙසක්, කොන්දේසියක් හෝ චක්‍රලේඛයක් උල්ලංඝනය කරමින් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු විසින් කිසිදු වෙළඳ ප්‍රචාරක දැන්වීමක් පලකිරීම, විකාශනය කිරීම, විසුරුවා හැරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

28. ප්‍රකාශයට පත්කරන ලද, විකාශනය කරන ලද, විසුරුවා හරින ලද හෝ ප්‍රදර්ශනය කරන ලද යම් වෙළඳ ප්‍රචාරක දැන්වීමක් 27 වන නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන බව හෝ ඒ මගින් මහජනතාව නොමග යැමට ඉඩ ඇති බව අධ්‍යක්ෂවරයාගේ මතය වන අවස්ථාවක, එම වෙළඳ ප්‍රචාරක දැන්වීම එකී ප්‍රකාශනයෙන්, විකාශනයෙන්, විසුරුවා හැරීමෙන් හෝ ප්‍රදර්ශනය කිරීමෙන් ඉවත් කරන ලෙස නැතහොත් සාධාරණ කාලයක් තුළ එම වෙළඳ ප්‍රචාරක දැන්වීම සංශෝධනය කරන ලෙස අධ්‍යක්ෂවරයා විසින් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුට නියම කරනු ලැබිය යුතු ය.

29. 27 වැනි හෝ 28 වැනි නියෝගවල විධිවිධාන වලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින යම් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු 26 වැනි නියෝගයේ විධිවිධාන වලට අනුව, අනුකූලව ක්‍රියා නොකිරීමේ ගාස්තුවක් ගෙවීමට යටත් විය යුතු අතර එකී අනුකූලව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා විසින් අවම වශයෙන් එක් සිංහල පුවත් පතක සහ එක් දෙමළ පුවත් පතක දැන්වීමක් පළකරනු ලැබිය හැකිය.

30. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ නියෝගවල -

"පනත" යන්නෙන්, 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත අදහස් වේ.

"කාඩ්පත් දරන්නා" යන්නෙන් නිකුත් කරන්නෙකු විසින් නිකුත් කරනු ලබන ගෙවීම් කාඩ්පතක් භාවිතා කිරීමට අවසරලත් යම් තැනැත්තෙක් අදහස් වේ.

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන් (422 වන අධිකාරිය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

"අයහාර කාඩ්පත" යන්නෙන් කාඩ්පත් දරන්නා වෙත නිකුත් කරන්නා විසින් ප්‍රදානය කරන ලද ණය මුදල් පෙළක් අදාළ වන්නා වූ ද, කාඩ්පත් දරන්නා විසින් භාවිතා කරනු ලබන ණය මුදල, තවදුරටත් ණය මුදල දීර්ඝ කිරීමකින් තොරව නිකුත් කරන්නා විසින් නිශ්චිතව දක්වනු ලබන දිනයක දී හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ගෙවා නිමකළ යුතු ණය මුදලක් අදාළ වන්නා වූ ද, ගෙවීම් කාඩ්පතක් අදහස් වේ.

"ණය කාඩ්පත" යන්නෙන් කාඩ්පත් දරන්නා වෙත එය නිකුත්කරන්නා විසින් ප්‍රදානය කරන ලද ණය මුදල් පෙළක් පෙන්නුම් කරන්නා වූ ද, කාඩ්පත් දරන්නා විසින් භාවිතා කරන ලද ණය මුදල සම්පූර්ණයෙන්ම හෝ කොටසක් නිශ්චිත දිනයකදී හෝ ඊට පෙර පියවිය හැකි ගෙවීම් කාඩ්පතක් අදහස්වේ. කාඩ්පත දරන්නා විසින් භාවිතා කරන ලද ණය මුදල නිශ්චිත දිනයකට හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ගෙවා නොමැති විට, එසේ නොගෙවා ඇති ණය ප්‍රමාණය යම් පොළියකට, ලාභයකට හෝ වෙනත් ගාස්තුවකට යටත් කළ හැකි වේ.

"දිනය" යන්නෙන් ලිත් දිනයක් අදහස් වේ.

"හර අයකිරීම් කාඩ්පත්" යන්නෙන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සහ / හෝ මුදල් ලබා ගැනීම ඇතුළුව, පිළියෙල කරගත් තුන් වන පාර්ශවයක් වෙත උපචිත වූ යම් බැඳීමක් ගෙවීමට භාවිත කරනු ලබන ගෙවීම් කාඩ්පතක් අදහස්වන අතර කාඩ්පත නිකුත් කළ ආයතනය සමග කාඩ්පත දරන්නා විසින් පවත්වාගෙන යනු ලබන ශේෂ ගිණුමකට කාඩ්පත් දරන්නාගේ බැරකම් සෘජුවම හර කරනු ලැබේ.

"මූල්‍ය අත්පත්කරු" යන්නෙන්, ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් කාඩ්පත් වෙළෙඳුන් විසින් පිළිගනු ලැබීමට හා ගනුදෙනුකරුවන් විසින් මිල දී ගනු ලබන භාණ්ඩ හෝ සේවාවල අගය වෙළෙඳුන්ට ආපසු ගෙවීමට වෙළඳුන් සමග වැඩපිළිවෙලක් සකස් කරනු ලබන යම් තැනැත්තකු හෝ කාඩ්පත් දරන්නන් විසින් කරනු ලබන මුදල් ඉවත් කිරීම් සඳහා මුදල් ඉදිරිපත් කරනු ලබන තැනැත්තකු හෝ අදහස් වේ.

"නිකුත් කරන්නා" යන්නෙන් ගෙවීම් කාඩ්පතක් නිකුත් කොට එසේ කිරීම මගින් කාඩ්පත් දරන්නා සමග ගිවිසුම්කාරී සම්බන්ධතාවයකට ඇතුළත් වන ආයතනයක් අදහස් වේ.

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ 1 වැනි කොටස යටතේ ශ්‍රී ලංකාවේ බැංකු ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට බලපත්‍රලත් සමාගමක් හෝ සංස්ථාවක් අදහස් වේ.

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නෙන් තැන්පතු මුදල් භාරගැනීමේ සහ එවැනි මුදල් ආයෝජනය කිරීමේ සහ ණයට දීමේ ව්‍යාපාරය පවත්වාගෙන යාමට 1988 අංක 30 දරන බැංකු පනතේ IX *(අ)* කොටස යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් සමාගමක් හෝ සංස්ථාවක් අදහස් වේ.

"වෙළෙන්දා" යන්නෙන් ගෙවීම් කාඩ්පත භාරගැනීමෙන් භාණ්ඩ සහ සේවා විකිණීමට නැතහොත් මුදල් ගෙවීමට නැතහොත් රාශිගත අගය විකිණීමට, හෝ මුදල් කිරීමට මූල්‍ය අත්පත්කරු සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති තැනැත්තෙකු අදහස් වේ.

"මුදල් අගය" යන්නෙන් 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනතේ 18 වැනි වගන්තියෙන් ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

"ක්‍රියාකරු" යන්නෙන් ගෙවීම් කාඩ්පතකට අදාළව හෝ ඉන් පැන නගින, යම් පද්ධතියක් ක්‍රියාත්මක කරන තැනැත්තකු අදහස් වේ.

"ගෙවීම් කාඩ්පත" යන්නෙන් මුදල් ලබාගැනීම සඳහා හෝ මුදල් ගෙවීම සඳහා කලින් කල භාවිතා කරනු ලැබිය හැකි වූ ද, සංකේතයක් හෝ වෙනත් ක්‍රමයක් ඇතුළුව, ගිණුමකට, රාශිගත අගයකට හෝ ණය මුදලකට ප්‍රවේශය ලබා ගැනීමේ යම් කාඩ්පතක්, තහඩුවක්, කූපන් පොතක් හෝ වෙනත් උපක්‍රමයක් අදහස් වන අතර ඊට හර අයකිරීම් කාඩ්පත්, අයභාර කාඩ්පත්, ණය කාඩ්පත් සහ අගය රාශිගත කාඩ්පත් ඇතුළත් වේ.

"පෙර ගෙවුම් කාඩ්පත්" යන්නෙන් කාඩ්පත් නිකුත් කරන්නා වෙත කාඩ්පත් දරන්නා විසින් යම් මුදලක් කෙලින්ම හෝ නිකුත් කරන්නාගේ අනුයෝජිතයකු හරහා කලින් ගෙවීමෙන් අත්කර ගන්නා ගෙවීම් කාඩ්පතක් අදහස්වන අතර, එම මුදල්වල වටිනාකම රාශිගත අගය වශයෙන් ගෙවීම් කාඩ්පතේ සටහන් කොට ඇත. තවද එකී වටිනාකම ගෙවීම් කාඩ්පතේ ඇති මුදල්වල වටිනාකමින් අඩුකිරීමට හෝ එක් වර්ගයක ගණුදෙනුවක දී හෝ විවිධ වර්ගවල ගණුදෙනුවලදී දැරීමට සිදුවන ගෙවීම් වගකීම් ඉටුකිරීමට ද භාවිතා කරනු ලැබේ.

"පොදු සමාගම" යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හෝ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත ඕනෑම සමාගමක් අදහස් වේ.

"ලියාපදිංචි මූල්‍ය සමාගම්" යන්නෙන් 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සමාගමක් අදහස් වේ.

"ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු" යන්නෙන්, ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නෙකු ලෙස හෝ ගෙවීම් කාඩ්පතක මුල්‍ය අත්පත්කරුවකු ලෙස හෝ කටයුතු කරනු ලබන, නැතහොත්, ගෙවීම් කාඩ්පත් සම්බන්ධයෙන් ගෙවීම් පද්ධතියක හෝ නිෂ්කාශන පද්ධතියක හෝ බේරුම් කිරීමේ පද්ධතියක ක්‍රියාකරුවකු වශයෙන් ක්‍රියා කරනු ලබන හෝ, එවැනි සේවා එකතුවක් ක්‍රියාත්මක කරන හෝ, තැනැත්තෙකු අදහස් වේ.

"අගය රාශිගත කාඩ්පත් " යන්නෙන්, —

(i) නිකුත් කරන්නා වෙළෙන්දකු වන්නා වූ ද, විශේෂිත භාණ්ඩ සහ / හෝ සේවා සඳහා වෙළෙඳුන් එක් අයෙකුට වැඩි ප්‍රමාණයක් සමග භාවිතා කළ හැකි වූ ද ඒකකාර්ය පෙර ගෙවුම් කාඩ්පතක් (ඒකකාර්ය බහු වෙළඳ) අදහස් වේ ;

(ii) නිකුත් කරන්නා වෙළෙන්දකු වූ ද, විවිධ භාණ්ඩ සහ / හෝ සේවා සඳහා වෙළෙඳුන්ට එක් අයෙකුට වැඩි ප්‍රමාණයක් සමග භාවිතා කළ හැකි වූ ද බහු කාර්ය පෙර ගෙවුම් කාඩ්පත් (බහු කාර්ය බහු වෙළඳ) අදහස් වේ ; හෝ

(iii) කාඩ්පත් නිකුත් කරන්නා භාණ්ඩ සහ / හෝ සේවා වෙළෙන්දකු නොවන තැනැත්තකු වන්නා වූ (වෙළෙන්දකු නොවන) තනිකාර්ය හෝ බහු කාර්ය පෙර ගෙවුම් කාඩ්පත් අදහස් වේ ;

"රාශිගත අගය " යන්නෙන්, 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනතේ 18 වැනි වගන්තියේ දී ඇති අර්ථය ම ඇත්තේය ;

"නිරවුල් ප්‍රාග්ධනය " යන්නෙන් ලියමක් හෝ වෙනත් ගාස්තු නොමැති ප්‍රාග්ධනයක් අදහස් වේ.

**1 වැනි උපලේඛනය**

*ඉල්ලුම්පත් අංකය :*

රහසිගතයි

**2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ, 2009 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සඳහා වූ නියෝග ප්‍රකාරව නිකුත් කරද ලද, ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු ලෙස ක්‍රියාකිරීමට බලපත්‍රයක් ලබාගැනීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය.**

***කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.***

| | | |
|---|---|---|
| ඉල්ලුම්පත්‍රය නිකුත් කළ දිනය | : | ……………………………………………… |
| නිකුත් කළේ කාටද | : | ……………………………………………… |
| ඉල්ලුම්පත්‍රය ලැබුණු දිනය | : | ……………………………………………… |
| සටහන් | : | ……………………………………………… |

වැදගත් —

යම් ප්‍රකාශයක් හෝ තොරතුරක් සාවද්‍ය බව දැන දැනම මේ ඉල්ලුම්පත්‍රයෙහි එවැනි ප්‍රකාශයක් කරනු ලබන හෝ එවැනි තොරතුරක් සපයනු ලබන සෑම තැනැත්තකුම 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය. එකී පනතේ 39 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි වේ :-

" (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් හෝ ඒ විධිවිධාන යටතට ගැනෙන යම් කාරණයක් සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ මඟ පෙන්වීමක්, විධානයක්, උපදේශයක් හෝ රීතියක් හෝ මේ පනත යටතේ යම් තොරතුරු, වාර්තා හෝ ලේඛන සඳහා හෝ යොමු කරනු ලැබූ නීත්‍යනුකූල ඉල්ලීමක් උල්ලංඝනය කරන හෝ පිළිපැදීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර -

*(i)* ස්වාභාවික තැනැත්තෙක් වන අවස්ථාවක, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය, නැතහොත්

*(ii)* වෙනත් යම් අස්තිත්වයක් වන අවස්ථාවක, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලබූ විට රුපියල් හත්ලක්ෂ පණස් දහසක් නොඉක්මවන දඩයකට යටත් වන්නේ ය.

(2) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ මඟ පෙන්වීම්, විධාන,උපදෙස් හෝ රීති සංස්ථාවක් විසින් හෝ පුද්ගලයකු නොවන වෙනත් නෛතික අස්තිත්වයක් විසින් හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක් හෝ සංවිධානයක් විසින් උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක, එහි සෑම අධ්‍යක්ෂවරයකුම, හා සාමාජිකයකුම අවස්ථාවෝචිත පරිදි එකී සංස්ථාව, නෛයික අස්තිත්වය හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලය හෝ සංවිධානය යටත් වන ආකාරයෙන්ම හා ප්‍රමාණයටම එම උල්ලංඝනය සඳහා වගකීමට යටත් වන්නේ ය. "

**උපදෙස් :**

(1) සෑම ඉල්ලුම්පත්‍රයක් ම යතුරුලියනය කළ යුතු ය. නැතහොත් පැහැදිලි නොබැඳි අකුරින් ලිවිය යුතු ය.

(2) ඉල්ලුම්පත්‍රයේ අදාල අයිතමයට අයත් සම්පූර්ණ විස්තර ඉදිරිපත් කිරීම සඳහා, දී ඇති ඉඩ ප්‍රමාණවත් නොවන්නේ නම්, අවශ්‍ය සෑම විටම වෙනත් පත්‍රයක් භාවිත කරන්න. තොරතුරු සහිත එවැනි වෙනත් පත්‍ර, අදාල අයිතමයට යොමුවන පරිදි සළකුණු කරන්න.

(3) (i) සම්පූර්ණ කරනු ලැබූ ඉල්ලුම්පත්‍රයක සෑම පිටුවකම සහ ඉහත (2) හි දක්වා ඇති පරිදි සෑම අමතර පත්‍රයකම, ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු ලෙස කටයුතු කිරීම පිණිස බලපත්‍රයක් ලබාගැනීමට අපේක්ෂා කරනු ලබන, (මෙහි මින් මතු ඉල්ලුම්කරු වශයෙන් හඳුන්වනු ලබන) ඉල්ලුම්කරන ආයතනයේ යටත් පිරිසෙයින් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුවත් කෙටි අත්සන් යෙදිය යුතු ය.

(ii) ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කරනු ලබන සියලු ම ලේඛන සහ ප්‍රකාශ, (විගණනය කරන ලද ශේෂ පත්‍ර හැර) ආයතනයේ අධ්‍යක්ෂවරුන් යටත් පිරිසෙයින් දෙදෙනෙකු විසින්, නිවැරදි සහ සත්‍ය බවට සහතික කළ යුතු ය.

(4) පහත සඳහන් දෑ ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය. (අදාළ වන පරිදි) :-

(i) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ ව්‍යවස්ථාවේ හෝ සමාගම ස්ථාපිත කිරීම හා සම්බන්ධ වෙනත් යම් ලේඛනයක හෝ පිටපතක්, යෝජිත සංශෝධන ඇත්නම් එකී සංශෝධන ද සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(ii) ඉල්ලුම්කාර සමාගම සංස්ථාපනය කිරීමේ ලේඛනයේ පිටපතක්.

ඉහත (i) සහ (ii) අයිතම සමාගම් රෙජිස්ටාර්වරයා විසින් සහතික කළ යුතු ය.

(iii) ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ස්ථාපනය කිරීමට අපේක්ෂිත සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ ව්‍යවස්ථාවේ කෙටුම්පතක පිටපතක් හෝ සමාගම ස්ථාපිත කිරීම හා සම්බන්ධ වෙනත් යම් ලේඛනයක පිටපතක් ;

(iv) අදාල වන්නේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සහ ඉල්ලුම්කාර සමාගමේ ලේකම් විසින් අත්සන් කරන ලද බලපත්‍රයේ පිටපතක් ;

(v) ගත වූ ආසන්නතම අවුරුදු 3 ට අදාල, ඉල්ලුම්කරුගේ විගණනය කරන ලද ශේෂ පත්‍ර සහ ලාභ අලාභ ගිණුම්වල පිටපත්. 2009 අංක 01 දරන ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සඳහා වූ නියෝග වල බැලපැවැත්වීමේ දිනයට පෙර ගෙවීම් කාඩ්පත් පිළිබඳ ව්‍යාපාරයක් ආරම්භ කරනු ලැබූ, එහෙත් අවුරුදු 3 ක කාලයක් සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම්කරුවකු විසින්, ස්වකීය ක්‍රියාත්මක සේවා කාලය සඳහා වූ විගණනය කළ ශේෂ පත්‍ර සහ ලාභ අලාභ ගිණුම් වල පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(vi) ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු ලෙස ව්‍යාපාරයක් ආරම්භ කළ එහෙත් එක් මුදල් වර්ෂයක් හෝ සම්පූර්ණ නොකරනු ලැබූ ඉල්ලුම්කරුවකු විසින් ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන මාසයට ඉහතින් වූ ආසන්නතම මාසයේ අවසාන දිනය වන විට ඔහුගේ ව්‍යාපාරයේ විගණනය කළ ගිණුම් ඉදිරිපත් කළ යුතු ය.

(vii) වෙළඳ වර්ග නාමය භාවිතා කිරීම පිළිබඳ ගිවිසුමේ පිටපතක් ( Brand user agreement)

(viii) ඉල්ලුම්පත්‍රයේ දින සිට ඉදිරි වර්ෂ තුන සඳහා වන සවිස්තරාත්මක ව්‍යාපාර සැලසුමක්

(ix) අවශ්‍ය අවස්ථාවන්හිදී අමතර ප්‍රාග්ධනය ලබා දීමට කොටස් හිමියන් විසින් දෙනු ලබන පොරොන්දුවක් සහ ඉල්ලුම්කාර සමාගමෙහි ඔවුන් විසින් කරනු ලැබූ දීර්ඝ කාලීන ආයෝජනයන්.

(x) යෝජිත සංවිධානයේ ව්‍යුහයේ දළ සැකැස්මක් සහ එහි ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ නම්, වගකීම් සහ අධ්‍යාපන සුදුසුකම්.

(xi) පද්ධති පාලනය හා අවදානම් කළමනාකරණය සඳහා වූ සූදානම සම්බන්ධ වාර්තාවක්.

(xii) ඉල්ලුම් පත්‍රයේ 1 වැනි කොටසේ 2 වැනි අයිතමයේ සඳහන් ප්‍රාග්ධන මට්ටමේ නිරවද්‍ය භාවය ස්ථිර කරන බාහිර විගණකවරුන්ගේ සහතිකය.

(xiii) සමාගමේ රෙජිස්ට්‍රාර්වරයා සහතික කළ 13, 36, 48 සහ 63 අංක්ම ආකෘති.

(xiv) අධීක්ෂණ අධිකාරියට අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු හෝ ලේඛන .

(5) ඉහත 4(viii) හි සඳහන් ව්‍යාපාර සැලැස්මේ පහත දැක්වෙන විස්තර ඇතුළත් විය යුතුය :-

(i) දැක්ම, මෙහෙය සහ අරමුණු සමග ක්‍රමෝපාය සැලැස්ම.

(ii) පවත්නා සහ යෝජිත ක්‍රියාකාරකම් වල දල සැකැස්ම සහ මෙහෙයුම් පරිමාණ.

(iii) අලෙවි සැලැස්ම සහ ඉල්ලුම්කරුගේ තරඟකාරී මට්ටම.

(iv) කාඩ්පත් නිකුත් කරන්නන් සම්බන්ධයෙන් ඃ දැනට සිටින සහ ඉලක්කකරන කාඩ්පත් දරන්නන් සහ එකී කණ්ඩායම් වල ජන විකාශ සංයුතිය.

(v) මුල්‍ය අත්පත්කරුවන් සම්බන්ධයෙන් ඃ දැනට සිටින වෙළඳුන්ගේ ලැයිස්තුවක් සහ ඉලක්ක කරන සේවාදායක සමුදාය පිළිබඳ විස්තර.

(vi) ප්‍රධාන කාර්යාලයේ පිහිටීම සහ පිහිටුවීමට අපේක්ෂිත ආනෙකුත් කාර්යාල හෝ මෙහෙයුම් මධ්‍යස්ථාන ජාලය පිළිබඳ විස්තර සහ එකී ජාලය ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන කාල පරාසය.

(vii) මෙහෙයුම්, ගෙවීම් ප්‍රවාහ සහ බේරුම් කිරීමේ වැඩ පිළිවෙල පිළිබඳ සවිස්තරාත්මක සටහනක්.

(viii) උපයෝගී කර ගන්නා තාක්ෂණය පිළිබඳ විස්තර

(ix) පහත දැක්වෙන දෑ ද ඇතුළත් ව්‍යාපාර මෙහෙයුම් පිළිබඳ අත්පොත ;

- නිකුත් කරන්නාගේ/ක්‍රියාකරුගේ සහ භාවිතාකරන්නාගේ අයිතීන් සහ බැඳීම් සඳහන් කෙරෙන රීති සහ පටිපාටි.

- භාවිතා කරන්නන්ට අදාල නියම සහ කොන්දේසි ද ඇතුළත්ව භාවිතා කරන්නාට මුහුණ දීමට සිදුවිය හැකි ආවදානම්,

- ආරවුල් විසඳීම සඳහා වන ක්‍රියාපටිපාටිය.

(x) අගය රාශීගත කාඩ්පත් නිකුත්කරන්නන් සඳහා ඃ භාවිතාකරන්නන්ගෙන් එක්රැස් කරගනු ලැබූ අරමුදල් කලමනාකරණය කිරීම සහ එකී අරමුදල් භාවිතාකරන්නන් සඳහා ඕනෑම වෙලාවක ලබා ගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා වූ වැඩපිළිවෙල.

(xi) නිකුත් කරන්නාගේ/ක්‍රියාකරු විසින් පනවනු ලබන ගාස්තු හා අයකිරීම්,

(xii) මූල්‍ය අත්පත්කරු විසින් පනවනු ලබන ගාස්තු සහ අයකිරීම්.

(xiii) තිබේ නම්, බාහිර ප්‍රභවයන්ගෙන් සේවා ලබාගැනීමේ වැඩපිලිවෙල.

(xiv) මුළු කාර්ය මණ්ඩල අවශ්‍යතා ඇස්තමේන්තුව සහ බඳවා ගැනීමේ සැලැස්ම.

(xv) තුන්වන පාර්ශවයක් සමග පවත්වන යම් අලෙවි හෝ එබඳු වෙනත් සන්ධාන පිළිබඳ විස්තර.

(xvi) මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා යෝජිත දිනය.

(xvii) ප්‍රථම අවුරුදු තුන සඳහා විස්තරාත්මක ශේෂ පත්‍ර, මුදල් ප්‍රවාහ සහ ඉපයීම් (උපකල්පන දක්වන්න).

(6) ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවෙකු ලෙස ඉල්ලුම්කරු ක්‍රියා කිරීමේ දී එම ආයතනයේ සහ පාලිත ආයතනවල මෙහෙයුම් වලට අදාළ වූ අවදානම් පාලනය කරීමට සහ සමීක්ෂණය කිරීමට භාවිතා කරනු ලබන අවදානම් කළමනාකරණ පද්ධතිවල හා ක්‍රියාපටිපාටිවල විස්තරවලට පහත දක්වෙන දෑ ඇතළත් විය යුතු ය :-

(i) ණය ප්‍රතිරක්ෂණ ප්‍රතිපත්ති ;

(ii) කොටස් හිමියන්, අධ්‍යක්ෂවරුන් සහ ආශ්‍රිත සම්බන්ධතා ඇති අයට ණය ලබා දීමේ ප්‍රතිපත්ති ;

(iii) ණය කාඩ්පත් ගිණුම්වල, ණයවල ගුණාත්මක භාවය මැනීමේ, වාර්තා කිරීමේ හා සමීක්ෂණය කිරීමේ ප්‍රතිපත්තිය හ අක්‍රිය ණය ගිනුම් සඳහා ප්‍රතිපාදන සැපයීමේ ප්‍රතිපත්තිය ;

(iv) වෙළෙඳුන් තෝරා ගැනීමේ ප්‍රතිපත්තිය (අනුක්‍රමික අඛණ්ඩ සමාලෝචන පටිපාටි අතුළුව) ;

(v) ද්‍රවශීලතා කළමනාකරණ ප්‍රතිපත්ති ;

(vi) මෙහෙයුම් අවදානම පාලනය කිරීම සඳහා ඇති ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිය (උදා ; පද්ධති අක්‍රිය වීම් සහ වංචා සමීක්ෂණය)

(vii) තොරතුරු සහ ගිනුම්කරණ පද්ධති පිළිබඳ විස්තර (අවදානම් කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා උත්පාදනය කරනු ලබන අභ්‍යන්තර වාර්තා වල ලැයිස්තුවක් ඇතුළුව) ;

(viii) තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි සහ පද්ධති පාලන විධි පිළිබඳ විස්තර ;

(ix) බාහිර ප්‍රභවයන්ගෙන් සේවා ලබාගැනීම සඳහා පවතින හෝ යෝජිත වැඩ පිළිවෙල පිළිබඳ විස්තර

(x) ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම පිළිබඳ විස්තර ; (ආපදාවන්ගෙන් වන පීඩාවලින් යථාතත්ත්වයට පත්වීම සහ ව්‍යාපාර කටයුතු සඳහා පද්ධතිවල අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම ඇතුළුව),

(xi) අභ්‍යන්තර පාලන ක්‍රම සහ පද්ධති විගණනය කිරීම ද ඇතුළත් විගණන වැඩසටහනේ විස්තර

(7) බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු අතර එය පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකි "අකෘතිය 1" අනුව පිළියෙල කළ යුතු ය.

අධ්‍යක්ෂ,
ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ.පෙ. 590,
කොළඹ 01.

(8) ඉල්ලුම්පත්‍ර ගාස්තුව : රු. 5,000.

ආකෘතිය **1**

**2005 අංක 28 දරන ගෙවීමේ බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ, 2009 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සඳහා වූ නියෝග ප්‍රකාරව නිකුත් කරන ලද, ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු ලෙස ක්‍රියාකිරීමට බලපත්‍රයක් ලබාගැනීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය**

අධ්‍යක්ෂ,

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ.පෙ. 590,
කොළඹ 01.

………………………………………………………………………………………

*(ලිපිනය)*

………………………………………………………………………………………..

………………………………………………………………………………………

*(ඉල්ලුම්කරුගේ නම)*

වන මම, ජනාධිපතිවරයා විසින් 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ සාදන ලද 2009 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සඳහා වූ නියෝග වල 3 වැනි නියෝගය ප්‍රකාර බලපත්‍රයක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත මෙයින් ඉල්ලුම්කර සිටිමි.

ඉල්ලුම්පත්‍රයට ආධාරක වශයෙන් පහත දැක්වෙන තොරතුරු සහ ලේඛන ඉදිරිපත් කරනු ලැබේ.

## 1 වැනි කොටස

**1. ඉල්ලුම්කරු පිළිබඳ සාමාන්‍ය තොරතුරු**

1.1 සංස්ථාගත කළ දිනය :

1.2 ව්‍යාපාරය ආරම්භ කළ හෝ ආරම්භ කිරීමට යෝජිත දිනය :

1.3 පහත සඳහන් ස්ථානවල ලිපිනය :

1.3.1 ලියාපදිංචි කාර්යාලය

1.3.2 ප්‍රධාන/පරිපාලන කාර්යාලය

1.3.3 ශාඛා කාර්යාලය/කාර්යාල

(සපයා ඇති ඉඩ ප්‍රමාණවත් නොවන්නේ නම්, අමතර කඩදාසි භාවිතා කරන්න.)

1.4 ඉල්ලුම්කාර සමාගමේ මුදල් වර්ෂය :

1.5 බලපත්‍රය අවශ්‍ය කරනු ලබන ව්‍යාපාරයේ විස්තරය (කාඩ්පත් නිකුත් කරන්නා/මුල්‍ය අත්පත්කරු/ගෙවීම් පද්ධතියේ ක්‍රියාකරු/ නිශ්කාෂණ පද්ධතියේ ක්‍රියාකරු/බේරුම් කිරීමේ පද්ධතියේ ක්‍රියාකරු) ඃ

1.6 සමාගම, ලැයිස්තුගත සමාගමක් ද යන වග සහ එසේ නම් කවදා සිට ද යන වග ඃ

1.7 ඉල්ලුම්කරු වෙනත් සමාගමක පාලිත හෝ ආශ්‍රිත සමාගමක් ද? සහ පොකුරු සමාගමක සාමාජික සමාගමක් ද ? කරුණාකර විස්තර සපයන්න. එය පාලිත සමාගමක් නම් පාලක සමාගමේ නම :

1.8 ඉල්ලුම්කාර සමාගමේ පිරිස් බලය (සංඛ්‍යාව සහ තනතුරු ආදිය) :

1.9 ඉල්ලුම්කරුගේ යෝජිත ව්‍යාපාරය සඳහා පාලිත සමාගම් වලින් සහ ආශ්‍රිත සමාගම් වලින් වත්කම් මාරු කර ගැනීම සඳහා යම් සැලසුම් ඇත් ද යන වග සහ ඒ පිළිබඳ විස්තර :

1.10 ඉල්ලුම්කරුගේ අනෙකුත් පාලිත සහ ආශ්‍රිත සමාගම් වල නම් (ඇත්නම්) :

1.11 සමාගමේ වැඩිම කොටස් ප්‍රමාණයක් දරන පළමු කොටස් හිමියන් දහ දෙනාගේ නම් සහ කොටස් වල නාමික අගයන් :-

| කොටස් හිමියාගේ නම | කොටස් ප්‍රමාණය | දරනු ලබන කොටස් වල නාමික අගය (රුපියල්) | නිකුත් කරනු ලැබූ කොටස් ප්‍රාග්ධනයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |
| 9. | | | |
| 10. | | | |

1.12 ඉල්ලුම්කරුගේ, බැංකුකරුගේ/බැංකුකරුවන්ගේ නම/නම් සහ ලිපිනය/ලිපිනයන් :

1.13 ඉල්ලුම්කරුගේ, ලේකම්ගේ නම සහ ලිපිනය :

1.14 බාහිර විගණකවරුන් :

1.14.1 බාහිර විගණකවරයාගේ නම :

1.14.2 ඔහු, ඉල්ලුම්කරු විගණනය කරනු ලැබුවේ කවර මුදල් වර්ෂයේ සිට ද ඃ

1.14.3 විගණක ආයතනයේ යම් හවුල්කරුවෙකු/අධ්‍යක්ෂවරයෙකු, ඉල්ලුම්කරුගේ කොටස්කරුවකු වන්නේ ද යන වග. (කරුණාකාර විස්තර සපයන්න)

1.14.4 අවසාන වර්ෂ තුන සඳහා ගෙවන ලද විගණන ගාස්තු :

1.14.5 විගණක ආයතනයට හෝ විගණක ආයතනයේ හවුල්කරුවකුට/අධ්‍යක්ෂවරයෙකුට ප්‍රදානය කරනු ලැබූ ණය පිළිබඳ විස්තර.

1.15 අභ්‍යන්තර විගණකවරුන් :

1.15.1 අභ්‍යන්තර විගණනකවරයා වාර්තා කිරීමට බැඳී සිටින අධිකාරියේ නම.

1.15.2 අභ්‍යන්තර විගණනකවරයා බාහිරව ලබා ගන්නේ නම්, විගණන ආයතනයේ නම.

1.15.3 අභ්‍යන්තර විගණනකවරයා බාහිරව ලබා නොගන්නේ නම්, පහත විස්තර සපයන්න.

1.15.3.1 අභ්‍යන්තර විගණනකවරයාගේ නම :

1.15.3.2 ඔහුගේ සුදුසුකම් සහ පළපුරුද්ද:

1.15.3.3 ඉල්ලුම්කරු සමග සේවයේ යෙදී සිටින වර්ෂ ගණන:

1.15.3.4 අභ්‍යන්තර විගණනකවරයාගේ මුළු කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ සුදුසුකම් :

| නම | සුදුසුකම් | සේවයේ යෙදී සිටින වර්ෂ ගණන |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

**2.** ප්‍රාග්ධනය

2.1 නිරවුල් ප්‍රාග්ධනය (අනුදත් ගෙවා නිම කළ ප්‍රාග්ධනය සහ අරමුදල්වල ප්‍රභවය )

රුපියල් මිලියන .....................

ප්‍රභවය: .......................

(පොදු සමාගමක් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස ඉල්ලුම් කිරීමට හිමිකම ලබන්නේ එහි ගෙවා නිම කළ ප්‍රාග්ධනය යටත් පිරිසෙයින් රුපියල් මිලියන හැත්තෑපහක් හෝ තිබේ නම් පමණි.)

2.2 ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ දිනයට පෙර ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරයක් ආරම්භ කළ ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් වන විට, අවසාන මුදල් වර්ෂ තුන සඳහා වූ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළ යුතු ය.

අවසාන මුදල් වර්ෂ තුන අවසානයේ ප්‍රාග්ධන තත්ත්වය.

| | **20……** | **20……** | **20……** |
|---|---|---|---|
| 2.2.1 නිකුත් කළ සහ ගෙවා නිමකළ ප්‍රාග්ධනය | | | |
| 2.2.1.1 සාමාන්‍ය කොටස් (ඡන්දය සහිත) | | | |
| 2.2.1.2 සාමාන්‍ය කොටස් (ඡන්දය රහිත) | | | |
| 2.2.1.3 වරණීය කොටස් | | | |
| 2.2.2 නිරවුල් ප්‍රාග්ධනය | | | |
| 2.2.3 සංචිත අරමුදල | | | |
| 2.2.4 පිළිඇගයුම් සංචිතය | | | |
| 2.2.5 කොටස් වාරිකය | | | |
| 2.2.6 පොදු සංචිතය | | | |
| 2.2.7 වෙනත් ප්‍රාග්ධන සංචිත | | | |
| 2.2.8 වෙනත් ආදායම් සංචිත | | | |
| 2.2.9 රඳවාගත් ලාභ හෝ පාඩු | | | |
| 2.2.10 කොටස් හිමියන්ගේ මුළු අරමුදල | | | |

2.2.11 සමාගම තම වත්කම් පිළිඇගයුම් කරනු ලැබුයේ නම් සහ සංචිත ගොඩනගා ඇත්නම් අමතර කඩදාසි භාවිතා කොට පහත දැක්වෙන විස්තර සපයන්න.

2.2.11.1 පිළිඇගයුමට ලක්වූ ගොඩ ඉඩම් සහ ගොඩනැගිලි වලට වැය වූ මුදල් සහ ඒවායේ පිහිටීම

2.2.11.2 දේපළ පිළිඇගයුම් කල දිනයන්

2.2.11.3 එක් එක් දේපළ පිළිඇගයීමේ දී ජනනය වූ අතිරික්තය

2.2.11.4 එක් එක් තක්සේරු වාර්තාවේ සහතික පිටපතක්.

3. **ඉල්ලුම්කරුගේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරි**
(සපයා ඇති ඉඩ ප්‍රමාණවත් නොවන්නේ නම්, අමතර කඩදාසි භාවිතා කරන්න.)

| අධ්‍යක්ෂවරයාගේ සම්පූර්ණ නම සහ ලිපිනය (සභාපතිවරයාගේ නම මුලින්ම දක්වන්න) | උපන් දිනය | සුදුසුකම් | පළපුරුද්ද | ජා.හැ. අංකය | විදේශ ගමන් බලපත්‍ර අංකය | ඔහු/ඇය කොතරම් කාලයක් අධ්‍යක්ෂවරයෙක්ව සිටියේ ද | අධ්‍යක්ෂවරයාට හෝ ඔහුගේ/ඇයගේ පවුලේ යම් සාමාජිකයකුට අදාළ සමාගමේ ඇති කොටස් සංඛ්‍යාව හෝ අධ්‍යක්ෂ වරයා හෝ ඔහුගේ/ඇයගේ පවුලේ යම් සාමාජිකයෙකු කොටස් හිමිකාරත්වය දරන වෙනත් ඕනෑම සමාගමකට අදාළ සමාගමේ ඇති කොටස් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 1. | | | | | | | |
| 2. | | | | | | | |
| 3. | | | | | | | |
| 4. | | | | | | | |
| 5. | | | | | | | |
| 6. | | | | | | | |
| 7. | | | | | | | |
| 8. | | | | | | | |
| 9. | | | | | | | |
| 10. | | | | | | | |

* සටහන - සෑම අධ්‍යක්ෂවරයකු විසින්ම මේ ඉල්ලුම්පත්‍රයට අමුණා ඇති පරිශිෂ්ටයේ නියමයන් හා අනුකූල විය යුතු ය.

## II වැනි කොටස

4. ඉල්ලුම්කරු ණය කාඩ්පත් / අයභාර කාඩ්පත් ව්‍යාපාරයේ නියුක්තව සිටී නම් අවසාන මුදල් වර්ෂය අවසානය වන විට පහත දැක්වෙන තොරතුරු සපයන්න:

| | ගිණුම් සංඛ්‍යාව | මුළු වටිනාකම (රුපියල්) (විලම්බන ප්‍රමාණයන් හැර) | උපචිත පොලිය සහ අනෙකුත් ගාස්තු (රුපියල්) | අවසාන මුදල් වර්ෂය අවසාන වන විට, විලම්බනව පවතින පොලී සහ අනෙකුත් ගාස්තු (රුපියල්) | ප්‍රතිපාදන සැපයුම (රුපියල්) |
|---|---|---|---|---|---|
| (i) පූර්ණ ලෙස ක්‍රියාත්මකව පවතින ණය ගිණුම් | | | | | |
| (ii) අක්‍රිය ණය ගිණුම් (අවම ගෙවීම, එය ගෙවිය යුතු දිනයේ සිට දින 90 ක් තුළ හිඟව පවතින) | | | | | |
| (iii) විශේෂයෙන් සඳහන් කරන ලද ණය ගිණුම් (අවම ගෙවීම, එය ගෙවිය යුතු දිනයේ සිට දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් දින 120 ට අඩු කාලයක් හිඟව පවතින) | | | | | |
| (iv) අවප්‍රමාණ ණය ගිණුම් (අවම ගෙවීම, එය ගෙවිය යුතු දිනයේ සිට දින 120 ක් හෝ ඊට වැඩි කාලයක් එහෙත් දින 180 කට අඩු කාලයක් හිඟව පවතින) | | | | | |
| (v) අවප්‍රමාණ ණය ගිණුම් (අවම ගෙවීම, එය ගෙවිය යුතු දිනයේ සිට දින 180 ක් හෝ ඊට වැඩි කාලයක් එහෙත් දින 240 ට අඩු කාලයක් හිඟව පවතින) | | | | | |
| (vi) බොල් ණය ගිණුම් (අවම ගෙවීම, එය ගෙවිය යුතු දිනයේ සිට දින 240 ක් හෝ ඊට වැඩි කාලයක් හිඟව පවතින) | | | | | |
| (vii) අධ්‍යක්ෂවරුන්ට ප්‍රදානය කරනු ලැබූ ණය | | | | | |
| (viii) සංස්ථායී ගනුදෙනුකරුවන්ට ප්‍රදානය කරනු ලැබූ ණය | | | | | |
| (ix) ණය කාඩ්පත් සහ අයභාර කාඩ්පත් යටතේ ප්‍රදානය කරනු ලැබූ ණය ප්‍රමාණයේ මුළු වටිනාකම | | | | | |
| (x) ණය කාඩ්පත් සහ අයභාර කාඩ්පත් යටතේ ප්‍රදානය කරනු ලැබූ සුරක්ෂිත නොකළ ණය ප්‍රමාණයේ මුළු වටිනාකම | | | | | |

5. අවසාන මුදල් වර්ෂයේ අවසානය වන විට ඉල්ලුම්කරු විසින් ලබාගෙන ඇති ණය ප්‍රමාණය

| ප්‍රභවය | ණය හෝ අයිරාව ලබාගත් දිනය | පොලී අනුපාතය | ප්‍රමාණය (රුපියල්) | සුරක්ෂිතයේ ස්වභාවය | නොගෙවා ඉතිරිව ඇති ප්‍රමාණය (ඉල්ලුම්පත්‍රයේ දිනය වන විට) |
|---|---|---|---|---|---|
| (i) බැංකු වෙතින් | | | | | |
| (ii) අධ්‍යක්ෂවරුන්ගෙන් | | | | | |
| (iii) වෙනත් පාර්ශ්වයන්ගෙන් (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න) | | | | | |
| එකතුව | | | | | |

6. ආශ්‍රිත අස්තිත්වයන් සඳහා ඉල්ලුම්කරු සපයා ඇති මූල්‍ය පහසුකම් (පාලක සමාගමක් වන්නා වූ සමාගමක්, පාලක සමාගමක පාලිත හෝ ආශ්‍රිත සමාගමක්, පාලක සමාගමේ පාලක සමාගමක පාලිත හෝ ආශ්‍රිත සමාගමක්, ඉල්ලුම්කරුගේ පාලිත හෝ ආශ්‍රිත සමාගමක්) එක් එක් අස්තිත්වය සඳහා වන තොරතුරු වෙන් වෙන්ව සපයන්න.

6.1 දෙන ලද ණය මුදලෙහි, අත්තිකාරම්වල හෝ මූල්‍ය පහසුකම්වල විස්තර, (ප්‍රමාණය, පොලී අනුපාතය, සුරක්ෂිතයන්, නොගෙවූ මුදල් ප්‍රමාණය)

6.2 සම්බන්ධිත සමාගම්වල, ඉල්ලුම්කරු දරා සිටින කොටස් පිළිබඳ විස්තර.

6.3 අවසාන මුදල් වර්ෂ තුන සඳහා සම්බන්ධිත සමාගම්වල විගණනය කරන ලද ගිණුම්.

7. අවසාන මුදල් වර්ෂය අවසානය වන විට ඉල්ලුම්කරුගේ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතම

| බැරකම් | දිනය | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන් වෙනුවෙන් දෙන ලද ඇප | | |
| පාලිත සහ ආශ්‍රිත සමාගම් වෙනුවෙන් දෙන ලද ඇප | | |
| අනිකුත් අය වෙනුවෙන් දෙන ලද ඇප (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න) | | |
| ශේෂ පත්‍රයෙන් බැහැර වෙනත් යම් බැරකම් | | |

8. ගාස්තු සහ අනෙකුත් අයකිරීම් (දැනටමත් ණය කාඩ්පත්/අයහාර කාඩ්පත් ව්‍යාපාරයේ නියුක්ත වී සිටින හෝ, ණය කාඩ්පත්/අයහාර කාඩ්පත් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන ඉල්ලුම්කරුවන් විසින් පිරවිය යුතු ය.)

| අයිතමයේ විස්තරය | ගාස්තු සහ අයකිරීම් (රුපියල්) හෝ ගාස්තු සහ අයකරීම් නිශ්චය කිරීමේ සූත්‍රය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8.1 වාර්ෂික ගාස්තුව | වෙළෙඳ වර්ග නාමය / කාඩ්පත් වර්ගය | වීසා | | මාස්ටර් කාඩ් | | එමෙක්ස් | | වෙනත් (විස්තර දක්වන්න) | |
| | | ප්‍රධාන | අතිරේක | ප්‍රධාන | අතිරේක | ප්‍රධාන | අතිරේක | ප්‍රධාන | අතිරේක |
| | ක්ලැසික්/ ස්ටැන්ඩර්ඩ් | | | | | | | | |
| | ගෝල්ඩ් | | | | | | | | |
| | ප්ලැටිනම්/ ප්‍රිමියර් | | | | | | | | |
| | වෙනත් | | | | | | | | |

| අයිතමයේ විස්තරය | ගාස්තු සහ අයකිරීම් (රුපියල්) හෝ ගාස්තු සහ අයකරීම් නිශ්චය කිරීමේ සූත්‍රය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8.2 බඳවා ගැනීමේ ගාස්තුව | වෙළෙඳ වර්ග නාමය / කාඩ්පත් වර්ගය | වීසා | | මාස්ටර් කාඩ් | | එමෙක්ස් | | වෙනත් (විස්තර දක්වන්න) | |
| | | ප්‍රධාන | අතිරේක | ප්‍රධාන | අතිරේක | ප්‍රධාන | අතිරේක | ප්‍රධාන | අතිරේක |
| | ක්ලැසික්/ ස්ටැන්ඩර්ඩ් | | | | | | | | |
| | ගෝල්ඩ් | | | | | | | | |
| | ප්ලැටිනම්/ ප්‍රිමියර් | | | | | | | | |
| | වෙනත් | | | | | | | | |

| අයිතමයේ විස්තරය | ගාස්තු සහ අයකිරීම් (රුපියල්) හෝ ගාස්තු සහ අයකරීම් නිශ්චය කිරීමේ සූත්‍රය | | | | |
|---|---|---|---|---|---|
| 8.3 මුල්‍ය අයකිරීම්<br>8.3.1 මිලදී ගැනීම් | වෙළෙඳ වර්ග නාමය / කාඩ්පත් වර්ගය | වීසා | මාස්ටර් කාඩ් | එමෙක්ස් | වෙනත් (විස්තර දක්වන්න) |
| | ක්ලැසික්/ ස්ටෑන්ඩර්ඩ් | | | | |
| | ගෝල්ඩ් | | | | |
| | ප්ලැටිනම්/ ප්‍රිමියර් | | | | |
| | වෙනත් | | | | |

| අයිතමයේ විස්තරය | ගාස්තු සහ අයකිරීම් (රුපියල්) හෝ ගාස්තු සහ අයකරීම් නිශ්චය කිරීමේ සූත්‍රය | | | | |
|---|---|---|---|---|---|
| 8.3 මුල්‍ය අයකිරීම්<br>8.3.2 මුදල් | වෙළෙඳ වර්ග නාමය / කාඩ්පත් වර්ගය | වීසා | මාස්ටර් කාඩ් | එමෙක්ස් | වෙනත් (විස්තර දක්වන්න) |
| අත්තිකාරම් අ. දේශීය | ක්ලැසික්/ ස්ටෑන්ඩර්ඩ් | | | | |
| | ගෝල්ඩ් | | | | |
| | ප්ලැටිනම්/ ප්‍රිමියර් | | | | |
| | වෙනත් | | | | |

| අයිතමයේ විස්තරය | ගාස්තු සහ අයකිරීම් (රුපියල්) හෝ ගාස්තු සහ අයකිරීම් නිශ්චය කිරීමේ සූත්‍රය | | | | |
|---|---|---|---|---|---|
| 8.3 මුල්‍ය අයකිරීම්<br><br>8.3.2 මුදල් අත්තිකාරම් ආ. විදේශීය | වෙළෙඳ වර්ග නාමය / කාඩ්පත් වර්ගය | වීසා | මාස්ටර් කාඩ් | එමෙක්ස් | වෙනත් (විස්තර දක්වන්න) |
| | ක්ලැසික්/ ස්ටැන්ඩර්ඩ් | | | | |
| | ගෝල්ඩ් | | | | |
| | ප්ලැටිනම්/ ප්‍රිමියර් | | | | |
| | වෙනත් | | | | |

| අයිතමයේ විස්තරය | ගාස්තු සහ අයකිරීම් (රුපියල්) හෝ ගාස්තු සහ අයකිරීම් නිශ්චය කිරීමේ සූත්‍රය | | | | |
|---|---|---|---|---|---|
| 8.3 මුල්‍ය අයකිරීම්<br><br>8.3.3 ශේෂය මාරු කිරීම | වෙළෙඳ වර්ග නාමය / කාඩ්පත් වර්ගය | වීසා | මාස්ටර් කාඩ් | එමෙක්ස් | වෙනත් (විස්තර දක්වන්න) |
| | ක්ලැසික්/ ස්ටැන්ඩර්ඩ් | | | | |
| | ගෝල්ඩ් | | | | |
| | ප්ලැටිනම්/ ප්‍රිමියර් | | | | |
| | වෙනත් | | | | |

| අයිතමයේ විස්තරය | ගාස්තු සහ අයකිරීම් (රුපියල්) හෝ ගාස්තු සහ අයකිරීම් නිශ්චය කිරීමේ සූත්‍රය | | | | |
|---|---|---|---|---|---|
| 8.4 අවම මාසික ගෙවීම | වෙළෙඳ වර්ග නාමය / කාඩ්පත් වර්ගය | වීසා | මාස්ටර් කාඩ් | එමෙක්ස් | වෙනත් (විස්තර දක්වන්න) |
| | ක්ලැසික්/ ස්ටැන්ඩර්ඩ් | | | | |
| | ගෝල්ඩ් | | | | |
| | ප්ලැටිනම්/ ප්‍රිමියර් | | | | |
| | වෙනත් | | | | |

| අයිතමයේ විස්තරය | ගාස්තු සහ අයකිරීම් (රුපියල්) හෝ ගාස්තු සහ අයකිරීම් නිශ්චය කිරීමේ සූත්‍රය | | | | |
|---|---|---|---|---|---|
| 8.5 ප්‍රමාද ගෙවීම් ගාස්තු | වෙළෙඳ වර්ග නාමය / කාඩ්පත් වර්ගය | වීසා | මාස්ටර් කාඩ් | එමෙක්ස් | වෙනත් (විස්තර දක්වන්න) |
| | ක්ලැසික්/ ස්ටැන්ඩර්ඩ් | | | | |
| | ගෝල්ඩ් | | | | |
| | ප්ලැටිනම්/ ප්‍රිමියර් | | | | |
| | වෙනත් | | | | |

| අයිතමයේ විස්තරය | දින ගණන | | | | |
|---|---|---|---|---|---|
| 8.6 පොළී රහිත කාල පරිච්ඡේදය | වෙළෙඳ වර්ග නාමය / කාඩ්පත් වර්ගය | වීසා | මාස්ටර් කාඩ් | එමෙක්ස් | වෙනත් (විස්තර දක්වන්න) |
| | ක්ලැසික්/ ස්ටැන්ඩර්ඩ් | | | | |
| | ගෝල්ඩ් | | | | |
| | ප්ලැටිනම්/ ප්‍රිමියර් | | | | |
| | වෙනත් | | | | |

| අයිතමයේ විස්තරය | හුවමාරු අනුපාතය නිශ්චය කිරීම සඳහා භාවිතා කරනු ලබන සූත්‍රය | | | | |
|---|---|---|---|---|---|
| 8.7 සූත්‍රය (කරුණාකර මුදල් වර්ග අනුව තොරතුරු සපයන්න). | වෙළෙඳ වර්ග නාමය / කාඩ්පත් වර්ගය | වීසා | මාස්ටර් කාඩ් | එමෙක්ස් | වෙනත් (විස්තර දක්වන්න) |
| | ක්ලැසික්/ ස්ටැන්ඩර්ඩ් | | | | |
| | ගෝල්ඩ් | | | | |
| | ප්ලැටිනම්/ ප්‍රිමියර් | | | | |
| | වෙනත් | | | | |

### III වැනි කොටස

9. ඉල්ලුම්කරුගේ පාලිත සහ ආශ්‍රිත සමාගම් (අවසාන මුදල් වර්ෂයේ අවසානයේ දී) වෙන් වෙන් කඩදාසි හෝ පත්‍ර භාවිතා කරන්න.

9.1 පාලිත හෝ ආශ්‍රිත සමාගම් වල නම්

9.2 ඉල්ලුම්කරු දරා සිටින කොටස් සංඛ්‍යාව සහ අගය

9.3 ව්‍යාපාරයේ ස්වභාවය

9.4 අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් සහ ඔවුන් අදාල සමාගම් වල දරනු ලබන කොටස් ප්‍රමාණය

9.5 සමාගමේ / සමාගම්වල අවසාන විගණක ගිණුම්

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනතේ 39 වැනි වගන්තියේ අන්තර්ගතය අප දන්නා බවත් ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස මේ ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාවය පිරික්සනු ලැබූ බවත්, සෑම අතින්ම එය සම්පූර්ණ බවත්, අපගේ උපරිම විශ්වාසයේ හා දැනීමේ හැටියට එකී තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් අපි ප්‍රකාශ කරමු. ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවකුට අදාල වූ සියලු ව්‍යාපාර කටයුතු අධීක්ෂණය හා අවේක්ෂණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය කරන කවර හෝ තොරතුරු සැපයීමට අපි බාරගන්නෙමු.

……………………………………………………………….. වෙනුවට

……………………………………………………………..

(ඉල්ලුම්කරුගේ නම)

